# බුදු ඉඳු පෙළහර වැනූ විදුසක්විතීන්

කනංගමුවේ රාහුල හිමි

## ග්‍රන්ථ නාමය

ග්‍රන්ථය අවසානයේ කතුවරයාත් කතුවරයා පොතට තැබූ ග්‍රන්ථ නාමයත් සඳහන් වෙයි. "විද්‍යාචක්‍රවර්තීන් කළ අමෘතාවහ නම් බුද්ධචරිතය නිමි"[1] අමෘතාවහ හා බුද්ධචරිත යන නම් දෙකම කතුවරයා තැබූ ග්‍රන්ථ නාමය වේ. නිවන් ගෙන දෙන අරුතින් අමෘතාවහ නම ද බුද්ධචරිතයේ සුවිශේෂී තැන් වර්ණිත බැවින් බුද්ධචරිතය යන නම ද තබා ඇත. නමුත් මේ පොත ප්‍රසිද්ධියට පත් වූයේ බුත්සරණ යන නමිනි. හුදෙක් එය ග්‍රන්ථයේ සෑම ඡේදයක් අවසානයේම සඳහන් "බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතු" පාඨය නිසාවෙනි. එසේම එයට අනුකූලවන ආකාරයෙන් දහම් සරණ හා සඟසරණ ග්‍රන්ථ දෙකක් ද ලියවී ඇති බැවින. දහම් සරණ හා සඟසරණ ග්‍රන්ථ දෙක ද විද්‍යාචක්‍රවර්තීන්ගෙන්ම බව පශ්චාත් කාලීන විචාරකයෝ පිළිගනිති.

> "මේ ග්‍රන්ථයට තැබූ විශේෂ සංඥාව "අමෘතාවහ" යන්නයි. අමෘත සංඛ්‍යාත නිර්වාණය ආවහනය කරන්නේය, ගෙන දෙන්නේය යනු එහි අර්ථයයි. "අමෘතාවහ නම් වූ බුද්ධ චරිතය නිමි" යි ග්‍රන්ථාවසානයෙහි පෙනෙන හෙයින් බුද්ධ චරිතය යනු සාමාන්‍ය සංඥාවයි. මෙහි වර්ණනා කරන ලද්දේ බුදුරජාණන් වහන්සේගේ චරිතයයි. එහෙත් ග්‍රන්ථයෙහි නොයෙක් තැන "බුත්සරණ" යනුම විශේෂ සංඥාව වශයෙන් ප්‍රචලිතය."[2]

"මෙම ග්‍රන්ථය ගත් කතුවරයන් හැඳින්වූයේ "අමෘතාවහ" යනුවෙනි. නිර්වාණ සංඛ්‍යාත වූ "අමෘතය ගෙන දෙන" යන අරුතින් ඒ නම යෙදූවා විය හැකිය. එහෙත් මෙය ව්‍යවහාරයට පත් වී ඇත්තේ බුත්සරණ යන නමිනි. ග්‍රන්ථයෙහි දැක්වෙන හැම ඡේදයක්ම වාගේ අවසන් වනුයේ "බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතු" යන පාඨයෙනි. පුන පුනා යෙදෙන බුත්සරණ යා යුතු යන පාඨය හේතු කොටගෙන ග්‍රන්ථයට බුත්සරණයි කියා ව්‍යවහාර වූහයි සිතිය හැකිය."[3]

1 බුත්සරණ. (සංස්) - ලබුගම ලංකානන්ද හිමි, 1968, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, පිටු අංක 360.
2 බුත්සරණ. (ප්‍රස්තාවනාව) (සංස්) - වැලිවිටියේ සෝරත හිමි, 2011, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, පි.අ. 01.
3 කුලසූරිය ආනන්ද, සිංහල සාහිත්‍ය 01, 1999, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පි.අ. 187.





## ග්‍රන්ථ කතුවරයා

මෙහි කතුවරයා පිළිබඳ කෙරෙන එකම විස්තරය නම් "විද්‍යාචක්‍රවර්ති" යන්න පමණකි. එය උපාධි නාමයකි. බුත්සරණ රචනා කළ විද්‍යාචක්‍රවර්තීන් ගුරුළුගෝමීන්ට පසුව පොළොන්නරු යුගයේම විසූ පඬිවරයෙක් බව බොහෝ උගතුන්ගේ පිළිගැනීමයි.

> "මේ පොතෙහි කර්තෘ වූ විද්‍යාචක්‍රවර්ති සැබවින්ම විද්‍යාචක්‍රවර්තියෙකි. සම්බුද්ධ ධර්මයෙහි හා නොයෙක් ශාස්ත්‍රාන්තරයන්හිත් අප්‍රතිහ බුද්ධි ප්‍රභාවයකින් යුක්තයෙකි. පැරණි සිංහල ග්‍රන්ථ කර්තෘවරයන් අතරෙහි ප්‍රතිභාන ඥානයෙන් විද්‍යාචක්‍රවර්තීන්ට සමවන්නේ කව්සිළුමිණ රචනා කළ කලිකාල සර්වඥ කවීශ්වර පණ්ඩිත දෙවැනි විජයබාහු රජතුමා පමණෙකි. අතිශයෝචිත චමත්කාර ජනක උපමා කීමෙහි මහා කවි කාලිදාසයන් ලැබූ කීර්තිය විද්‍යාචක්‍රවර්ති මහා කවි තෙමේ මේ එකම පොතෙන් පරදවයි."[4]

## වස්තු විෂය හා ග්‍රන්ථ ප්‍රමාණය

බුත්සරණෙහි වස්තු විෂය බුද්ධචරිතයයි. නව අරහාදී බුදුගුණ වර්ණනා කිරීම බුත්සරණ කතුවරයාගේ අභිප්‍රාය වී ඇත. බුත්සරණෙහි පැහැදිලි සන්දර්භයක් නැත. පරිච්ඡේද වශයෙන් බෙදා වෙන් කිරීමක් ද නැත. බුද්ධ චරිතය සඳහාම ලියූ අමාවතුරෙහි මනා ආකෘතියක් ඇත. පුරිසදම්මසාරථී පදය පමණක් තේමා කරගෙන ඇත. එහෙත් බුත්සරණ-යෙහි කියූ බුදු ගුණ ගැන නැවත නැවතත් කියයි.

> "බුත්සරණේ ආශ්‍රය සෙවීම පහසු කටයුත්තක් නොවේ. ඊට එක් හේතුවක් නම් එහි බුද්ධ චරිත කථා පමණක් නොව ධර්ම කොටස් ද නො අඩුව යෙදීමයි. කථා වස්තු එකම පොතකින් තෝරා ගන්නා ලද ඒවා නොවෙයි. ධර්ම කොටස් ද එසේම එකම පොතකට සීමා වූ බවක් නොපෙන්..... මෙහි අන්තර්ගත වූ ජාතක කථා සංග්‍රහය ද අන්‍ය කථා වස්තු ද සලකා බලන කල්හි කතුවරයන් ජාතකට්ඨ කථාවද, ධම්මපදට්ඨ කථාව ද කියූහයි සිතිය හැකිය. එසේම බුදුන්ගේ චරිත කථාව දැක්වෙන පාරමිතා කොටසට විමාන වත්ථු පේතවත්ථු ආදී පොත් වහල් කෙට ගන්නා ලද බව සිතිය හැකිය. තවද "ලෝකවිදූ" යන පදය විස්තර වන පරිදි ලියා ඇති ලෝක විවරණ කාණ්ඩය විශුද්ධිමග්ග, ජානුස්සති, අභිඤ්ඤානිද්දේශ, මජ්ඣිම නිකාය, පොතලිය, සුත්තට්ඨ කථා, ඡද්දන්ත ජාතකය, ධම්මපදට්ඨ කථා, සංයුත්ත නිකායට්ඨ කථා, දීඝ නිකාය, මහා ගෝවින්ද සූතතට්ඨ කථා යනාදී ග්‍රන්ථයන්ගෙන් කරුණු එක් රැස් කොට රචනා කරන ලද බව කියා තිබේ. ගුරුළුගෝමීන්ගේ අමාවතුරට වස්තු වූ දේත්, විද්‍යාචක්‍රර්තීන්ගේ බුත්සරණට වස්තු වූ දේත් බෙහෙවින් එක හා සමානය."[5]

4 බුත්සරණ. (ප්‍රස්තාවනාව) (සංස්) - වැලිවිටියේ සෝරත හිමි, 2011, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, පි.අ. 02.

පරිච්ඡේද වෙන් කරනු වෙනුවට කතුවරයා කර ඇත්තේ ඡේද වශයෙන් වෙන්කොට ඒ හැම ඡේදයක් අවසානයේම බුදුන් සරණ යෙමියි බුත්සරණ සරණ යා යුතු යනුවෙන් සඳහන් කිරීමයි. ලබුගම ලංකානන්ද හිමියෝ සිය බුත්සරණ සංස්කරණයෙහි කතුවරයා කරුණු ගොණු කිරීමේදී සිත්හි තබා ගත් පිළිවෙළක් අනුව යමින් බුත්සරණ පරිච්ඡේද 16 කට බෙදා දක්වති. එනම්,

1. භගවා ඃ- ඡේද 30 කි. විමානවත්‍ථු, පේතවත්‍ථු, ධම්මපදට්ඨ කථා, ජාතක කතා ආදී ග්‍රන්ථයන්ගෙන් තොරතුරු ගෙන ඇත.
2. අරහං ගුණය ඃ- විශුද්ධිමාර්ගය උපයෝගී කරගෙන ඇත.
3. සම්මා සම්බුද්ධෝ
4. විජ්ජාචරණ සම්පන්නෝ ඃ- අෂ්ටවිද්‍යා, පංච දශ චරණ, ආදිය විවරණය කරයි.
5. සුගතෝ
6. ලෝක විදූ ඃ- විශුද්ධි මග්ග, ජානුස්සති අභිඤ්ඤා නිද්දේශ, මජ්ඣිම නිකාය, පොතලිය සුත්තකට්ඨ කථා, ධම්මපදට්ඨකථා, සංයුක්ත නිකාය කථා, දීඝ නිකාය, මහා ගෝවින්ද අට්ඨකථාව ආදිය ආශ්‍රය කරගෙන ඇත.
7. අනුත්තරෝ
8. පුරිස දම්මසාරථී ඃ- ආලවක නාලාගිරි, ජටිල සච්චක, දැමූ පරිදි කියා ඇත.
9. සත්‍ථා දේවමනුස්සානං
10. බුද්ධෝ
11. නැවතත් භගවා යන බුදු ගුණය වර්ණනා කරයි.
12. බුදුන්ගේ දේශනා විලාශය
13. රූපකාය සම්පත්තිය
14. ධර්මකාය සම්පත්තිය ඃ- පුබ්බේනිවාසානුස්සතිය, ඍද්ධිබල ආදි ගුණ
15. උපමා කාණ්ඩය
16. වෙස්සන්තර ජාතකය[6]

ජාතකපාලිය, ජාතකට්ඨ කථා, චරියා පිටක, ජාතකමාලාව ආදීන්හි පැණෙන වෙස්සන්තර ජාතකය බුත්සරණ අවසානයට යොදන්නට ඇත්තේ තත්කාලීන සමාජයේ ඒ සඳහා ජනප්‍රියත්වයක් ලබා තිබීම මෙන්ම බෝසත් චරිතයේ සුවිශේෂී ලක්ෂණ පෙන්නුම් කෙරෙන නිසාවෙන් විය හැකිය. වෙස්සන්තර ජාතකය පසුකාලීනව බුත්සරණට එකතු කරන්නට ඇතැයි ඇතැමෙක් විශ්වාස කරති. නමුත් එයටත් අවසානයේම "විද්‍යාචක්‍රවර්ති කළ අමෘතවහ නම් බුද්ධචරිතය නිමි" යනුවෙන් සඳහන් වී තිබීමෙන් එය විද්‍යාචක්‍රවර්තිගේම නිර්මාණයක් බව තීරණය කිරීමට පුළුවන.

6 බුත්සරණ, (සංස්) - ලබුගම ලංකානන්ද හිමි, 1968, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, පිටු අංක 360.





බුත්සරණෙහි තෝරාගෙන ඇති කතා දෙස බැලීමේ දී පැහැදිලි වන්නේ බුදුන්ගේ අධ්‍යාත්මික ගුණ ප්‍රකට කෙරෙන මෙන්ම ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය ගුණයන් ප්‍රකට කෙරෙන අවස්ථාවන් වර්ණනා කිරීමට කතුවරයා දැඩි ප්‍රියතාවයක් දක්වා ඇති බවයි. බුත්සරණෙහි වස්තු විෂය දෙස බැලීමෙන් ඒ බව පෙනේ. ඇතැමෙක් තත් වස්තු විෂය මෙසේ බෙදා දක්වති.

1. ප්‍රකීර්ණක කාණ්ඩය ඃ- බුදුගුණ බුද්ධ චරිතයේ විශේෂ සිදුවීම් - ජාතක කතාවන්හි සාරාංශය ආදියෙන් බුදුන්ගේ ශ්‍රේෂ්ඨත්වය විදහා පෑමට ප්‍රයත්න දරා ඇත.
2. ලෝක විවරණ කණ්ඩය ඃ- බුදුන්ගේ ආධ්‍යාත්මික ගුණයට වඩා ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය ගුණය හුවා දක්වා ඇත. විශේෂයෙන් මෙහි දී කතුවරයාගේ ඥාන සම්භාරය ප්‍රකට කෙරෙයි. ඇතැම් පාඨ බුදුන්ගේ ආධ්‍යාත්මික බාහිර කිසිදු ගුණයක් ප්‍රකට නොකෙරෙන බව ද පෙනෙයි.
3. අංගුලිමාල
4. නාලාගිරි දමනය
5. නන්දෝපනන්ද දමනය
6. තීර්ථක දමනය
7. ජටිල දමනය
8. ආලවක දමනය
9. ගංගාරෝහණ කථා
10. මණ්ඩුක දිව්‍ය පුත්‍ර කථා
11. පරිබ්‍රාජක දමනය
12. සච්චක බ්‍රහ්ම දමනය
13. බක බ්‍රහ්ම දමනය
14. පටාචාරා චරිතය
15. මිශ්‍ර කථා කාණ්ඩය
16. වෙස්සන්තර ජාතකය

මෙහි මිශ්‍ර කාණ්ඩය ද ප්‍රකීර්ණක කාණ්ඩයෙන් අපේක්ෂිත අරමුණු සඳහාම යොදාගෙන ඇත. මුලින් කියූ දේම නැවත නැවතත් උපමා මගින් ගෙනහැර දැක්වීම මෙහිදී කර ඇත. කතුවරයාගේ පාණ්ඩිත්‍යය හුවා දක්වා ඇත. බණ හමාර කොට එහි අඩුවක් පිරවීම සඳහා ගත් තැනක් වශයෙන් මිශ්‍ර කතා කාණ්ඩය හැඳින්වීමට පුළුවන. විශේෂයෙන් ප්‍රකීර්ණක කාණ්ඩයේ පැණෙන තොරතුරු බැලීමෙන් පෙනෙන්නේ කතුවරයා ඒ ඒ අවස්ථාවට තම සිතට නැගුණු කරුණු ඉදිරිපත් කර ඇති බවයි. මෙහිදී අපගේ උත්සාහය වන්නේ බුත්සරණෙහි සියලු වර්ණනා ගැන විමසීම නොවේ. කතුවරයා බුදුන්ගේ ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය පිළිබඳ වර්ණනා කළ ආකාරය පිළිබඳව විමසා බැලීමයි.

## ඍද්ධි ප්‍රාතිහාර්ය ගුණ සංවර්ණනාව

බුදුන් වහන්සේ කෙරෙහි උපන් අසීමිත බැතියෙන් හා ගෞරවයෙන් ඉපිළී ගිය විද්‍යාචක්‍රවර්තීන් බුදුගුණ කිය කියා සතුටු වූ අයුරු බුත්සරණින් මනාව දැක ගැනීමට පුළුවන. පිටක ග්‍රන්ථවල සඳහන් තොරතුරු රැගෙන එහි වර්ණනා වියයුතු තැන් ඉතා හරවත් කොට තෙදවත් කොට ඔදවත් කොට සරස සරසා ලිවීය. ගුරුළුගෝමීන් පාඨකයාගේ හා ශ්‍රෝතෘ ජනතාවගේ බුද්ධියට කියූ තොරතුරු විද්‍යාක්‍රචක්‍රවර්තීන් ඔවුන්ගේ හදවතට ගෝචර වන පරිදි රචනා කළේය. විශේෂයෙන් බුදුන් වහන්සේගේ ඍද්ධි විෂය වර්ණනා කළ යුතු අවස්ථා හා සිද්ධි දක්වන තැනේ දී විද්‍යාචක්‍රවර්තීන් වර්ණනා ශෛලියෙන් පෝෂණය කොට ලිවීය. ගද්‍ය කාව්‍ය ගණයෙහිලා සංගෘහිත කළ හැකි බුත්සරණ එම කාව්‍ය ගුණයෙන්ම බුදුන් වහන්සේගේ ඍද්ධි විෂය පිළිබඳව වර්ණනා කළේය. විවිධ සාහිතය ලක්ෂණ ද උපයෝගී කරගත් විද්‍යාචක්‍රවර්තීන් එමගින් තම රචනා තියර පෝෂණය කර ගත්තේය. ධර්ම දේශකයෙකුගේ දේශනා ව්‍යවහාරයට අනුගතව රචිත බුත්සරණ කෘතිය තුළ බුදුගුණ උත්කෘෂ්ටව වර්ණනා කිරීම ද අරුමයක් කොට තැකිය නො හැකිය.

අතිශය වර්ණනා රීතිය ගුරුකොට ගත් බුත්සරණ කතුවරයා බුදුන් වහන්සේගේ වාග් විෂයාතික්‍රාන්ත වූ ඍද්ධි විෂය පිළිබඳව කෙසේ වර්ණනාවක යෙදෙන්නේ දැයි උදාහරණ කීපයක් ගෙන විමසා බැලිය යුතුය.

"විද්‍යාචරණසම්පන්නෝ" යන බුදුගුණය විස්තර කරන්නට බට විද්‍යාචක්‍රවර්තීන් මුල් අවස්ථාවේ දී එම ගුණයටම අනුගත වන කාරණා එකොළසක් යටතේ කරුණු ඉදිරිපත් කොට ඇත. එහි "මනෝමයිද්ධි" හා "ඉද්ධිප්පභේද" යන පද දෙකට විස්තර සපයන තැනෙක්හිදී බුදුන් වහන්සේගේ ඒ අනුත්තර වූ ඍද්ධි විෂය පිළිබඳ වර්ණනාවක යෙදෙයි. ඒ මෙසේය.

> "තුමූ හුදෙකලා වැ සිට තමන් සේ වූ බුදු රූ දහස් ගණන් මවා මුළු ලෝ සදා පහදා බොහො වැ පැනී යන්නා වූ නැවත ඒ රූ හැම අන්තර්ධාන කොටැ හුදෙකලා බුදුරුව පෑ ලොවට විස්මය එළවන්නා වූ එක් විටෙක ක්ෂණයෙහි වසාපු පහනක් සේ අන්තර්ධානවැ යන්නා වූ නැවත එක් විටෙක වලා යටින් නික්මෙන පූර්ණ චන්ද්‍ර මණ්ඩලයක් සේ එක විට පැනී යන්නා වූ එක් ලක්ෂ හැට දහසක් යොදුන් මහමෙරින් ඈතට යම් යි සිතූ වේලෙහි මැ මකුළුහුයෙක් හි නො පැකිළැ යන මතැතක්හු සේ ඈත පැනීය. අහස්හි දූ පොළොවෙහි දූ පොකුණෙක්හි දූ කුමුදුනා සේ කිම්දැ යා ගෙන....."



ජිනරතනාභිනන්දන - ශාස්ත්‍රීය සංග්‍රහය

"ඉද්ධිප්පභේද"යන තන්හි කතුවරයා බුදුන් වහන්සේගේ ඒ අසිරිමත් ප්‍රාතිහාර්ය පිළිබඳව වර්ණනා කරන්නේ එලෙසිනි. උන්වහන්සේ වනාහි තමන් සේම බුදුවරුන් දහස් ගණන් මවා පෑමෙහි සමර්ථයහ. එතෙකුදු නොවේ. ඒ මවා පෑ හැම බුදුවරයාණ කෙනෙකුන්ම අතුරුදන් කොට තමන් වහන්සේ පමණක්ම පෙනී සිටින්නාහ. තවද උන්වහන්සේ වනාහි පූර්ණ චන්ද්‍ර මණ්ඩලයක් සෙයින් අහසෙහි පෙනී හිඳ මහත් වූ මහමෙර ගලින් ඈතට වැඩම කොට එහි බලා හිඳින්නා වූ ජනයන්ට පෙනී යන්නාහ. අහසෙහිත් ජලයෙහිත් සක්මන් කරන්නා වූ විලාස දක්වන්නාහ. මෙවැනි පෙළහර පෑමෙහි සමත් බුදුන් වහන්සේ සඳ හිරු දෙදෙනා තමන් වහන්සේ වෙතට ගෙන්වා තම ශ්‍රී පාද පද්මයෙහි ස්පර්ශ කරන්නාහ. මෙම වර්ණනා පාඨය නිතැතින්ම පාඨකයා තුළ ශ්‍රද්ධා භක්ති ජනනයෙහිලා මහෝපකාරීය. එම අවස්ථාව වර්ණනා කිරීමේදී විද්‍යාචක්‍රවර්තීන් උපමාදී අලංකාර උපයෝගී කරගෙන තරමක් දිගු වර්ණනාවක් ඉදිරිපත් කරන බව පෙනේ. එය කතුවරයාගේ අභිමත වූ අනුගත වූ විශේෂිත රචනා රීතියයි. එමගින් එළවන්නා වූ භක්ති රස ජනනය ද ඉහළය.

කතුවරයා බුදුන් වහන්සේගේ මහාත්මය වූ ඒ ඍද්ධි ප්‍රාතිහාර්ය බල මහිමයේ තරම කියන්නට යන තැනේදී බුදුන් වහන්සේගේ මුවගට නංවන වදන් ඒ නිහතමානි බුදු ගුණයට දොසක් නගන දෝ හෝයි සිතෙන තැන් ද දැක ගැනීමට පුළුවන.

> "මේ හැම අසා බුදුන් වහන්සේ තොප හැම දෙනා මෙකී කී පෙළහර පෑමෙහි ශක්ති ඇති බව දන්මි. එතෙකුදු වුවත් මුළු ලොවට විස්මය එළවා මා පානට සිතන්නා වූ පෙළහර තොපට නො පිළිවන. දැන් මා බුදු වූ කලැ තමා බෝධිසත්ව භූමියෙහි තිරිසන්වැ ඉපිදැ මා කලැ ආශ්චර්ය මුළු ලොව සත්වයෝත් කරන්නට අසමර්ථයෝ' යැයි කණ්හ ජාතකය ගෙනහැර වදාරා..."

මෙම වර්ණනාව බුදුන් වහන්සේගේ ඒ උතුම් වූ ඍද්ධි ප්‍රාතිහාර්යයේ බලය දක්වන්නා වූ වර්ණනාවකි. තමන් වහන්සේ තරම් අනෙකෙක් ඍද්ධි බල දක්වන්නට අසමර්ථයහ, යන බුදු වදනෙහි අසත්‍යයක් නැත ද එය බුදු වදනට මුසු නොකොට සව්වෙකුගේ මුවගට නැංවූයේ නම් ඉතා වටිනා වර්ණිත අවස්ථාවක් සේ ගත හැකිය. අත්තුක්කංසනය හා පරවම්භනය බුදුදහම ප්‍රතික්ෂේප කරයි. එය බුදු බැතිය වඩවනවා වෙනුවට කෙරෙන වෙනත් හැඟීම් උද්දීප්තියකි.

ඉහත දැක්වූ වර්ණනා පාඨයත් සමගම කතුවරයා බුදු කෙනෙකුන්ටම පමණක් විෂය වන සේ අසමසම, අතුල්‍ය වූ යමාමහ පෙළහර පිළිබඳ ඉතා දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කරයි. මුද්‍රිත පිටු එක හමාරක් පමණ වන එම වර්ණනාව ඉතාමත් සිත් එළවන සුලුය. ගුරුළුගෝමීන්ට වඩා ඉතා සවිස්තරාත්මක වර්ණනාවක් මෙහිදී විද්‍යාචක්‍රවර්තීන් ඉදිරිපත් කොට ඇත.

"ඉදිරියෙන් දොළොස් යොදුන් පිරිසයැ. පස්සෙහි දොළොස් යොදුන් පිරිස යැ. දැළයෙහි දොළොස් යොදුන් පිරිසයැ. මෙසේ සතර දිගින් සූ විසි යොදුන් පමණ තැන් පිරිස මැද රුවන් සක්මනට සර්වඥයන් වහන්සේ පැන නැඟී සිටුත් මැ ශ්‍රී ශරීරයෙහි නාභියෙන් මත්තෙහි තුන්ලොව බබුළුවන්නා වූ මහා ගිනි කඳෙක් නැඟෙන්නට වන නැවත නාභියෙන් පාත ශ්‍රී ශරීරයෙන් ආකාශ ගංගා ප්‍රවාහයක් සේ මහා දිය කඳෙක් හෙන්නට වන. නැවත ගිනි කඳක් නැඟී උර්ධ්වකායයෙන් දිය කඳෙක් හෙන්නට වන දිය කඳ හුණු අධඃකායයෙන් ගිනි කඳෙක් නැඟෙන්නට වන.... මෙසේ නැඟෙන්නා වූ වහ්නිස්කන්දය හා ජලස්කන්ධය ද අතරතුරෙන් සවනක් ගණ බුදුරැස් ඊ වලඳමින්, ඉන් ඊ පෙරැළෙමින් ඉන් ඊ රැඳෙමින්, ඉන් ඊ කරකැවෙමින් මුළු සක්වලැ මැඬ ගෙනැ දිවන්නේයැ. අග්නිස්කන්ධය හා ජලස්කන්ධය හා දෙකම බඹ ලොව දක්වා නැඟී ආයේ පෙරළා අවුත් දෙයාසූ දහසක් යොදුන් සක්වල ගල්මුව විටැ ගැසී පරසක්වල මැඬගෙන දිවන්නේයැ. ඒ අතරතුරින් දිවන්නා වූ සවනක් ගණ බුදුරැස් විහිදුවා පියා කළ මුව විටින් නමන රන්රස සේ යන්ත්‍ර නළින් මැඬ නඟනා දෙයක් සේ එසේමැ භාවාග්‍රය දක්වා පෙරළී අවුත් සක්වල ගල් මුවවිට ජල කඳෙක් නැඟෙන්නට වනැයි කියා තම වර්ණනාව අවසන් කරන්නට විද්‍යාචක්‍රවර්තීන්ට අවස්ථාව තිබුණත් ඔහු එය කෙටි වැනුමකින් හමාර නො කළේය. තම අභිමත විචිත්‍ර වර්ණනා මාර්ගයෙන්ම එම අවස්ථාව වර්ණනා කරමින් කතුවරයා බලාපොරොත්තු වී ඇත්තේ පාඨකයාගේ සිත් සතන් තුළ වැඩි වැඩියෙන් බුද්ධාලම්බන ප්‍රීතිය උපදවා ලීම විය හැකිය. එමතු ද කතුවරයා උපමා යොදා ගනිමින් කරන එම වර්ණනාව ඉතා සිත් ගන්නා සුළුය.''

බුදුන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් විහිදෙන්නා වූ වහ්නිස්කන්ධය හා ජලස්කන්දය මුසු වූ සවනක් ගුණ බුදුරැස් බඹ ලෝ දක්වාත්, භවාග්‍රය දක්වාත් එක පැහැර සැදී විහිදෙන්නේය. ජලකඳ ගිනිකඳ අතර මුසුවන සවණක් ගණ බුදුරැස් ඒ තුළ වැදෙමින්, රැඳෙමින්, පෙරළෙමින්. හා කරකැවෙමින් මුළු සක්වල වසාගෙන විහිද යන අයුරු සිතුවම් පටකින් දක්නා සේ පාඨකයාගේ මනසෙහි චිත්‍රිත කිරීමට සමත් වර්ණනා අවස්ථාවක් ලෙස මෙම වැනුම අගය කිරීමට පුළුවන. "සියලු සක්වල ගබ සත් රුවනින් ගොනැසියන් සදාලූ මඬුවක් සේ එක පැහැර දිලියෙන්නට වන" යි කතුවරයා උපමාලංකාරාදිය යොදා ගනිමින් එම අවස්ථාව තවදුරටත් වර්ණනාවට හසුකර ගනියි. එමගින් පමණක් නො නැවතුණු කතුවරයා තවදුරටත් මුද්‍රිත පිටුවකින් පමණ එම අසිරිමත් පෙළහර වර්ණනාව ඉදිරිපත් කොට ඇත. සඳ දෙස බලාගෙන එයට ලොල්ව හඬනා කුඩා ළදරුවෙකු සේ විද්‍යාචක්‍රවර්තීන් මේ වාග් විෂයාතික්‍රාන්ත වූ අසිරිමත් බුදු පෙළහරට ලොල් උපදවා තම වර්ණනාව ඔදවත් කොට තෙදවත් කොට රසවත් කොට වර්ණනා කරයි. මේ රචනා නියර කවරෙකුගේ වුවද හදවතෙහි බුදුන් වහන්සේ කෙරෙහි භක්තිය, ගෞරවය හා ශ්‍රද්ධාව ජනිත කරවීමට සමත්කම් ඇති රචනා විලාසයක් සේ අගය කළ හැකිය.



479-6



බුදුන් වහන්සේ තව්තිසා දෙව්ලොව වඩින්නට මත්තෙන් එවැනි විස්මිත බුදු පෙළහර දක්වා බොහෝ ප්‍රාණීන්ට වැඩ සැලසූ සේක. විජම් බණ දෙසන්නට බුදුන් වහන්සේ තව්තිසා වැඩි සේක. ඉන් පසුව එහිදී බුදුන් වහන්සේට ධර්මාසනය වන්නේ ශක්‍ර දේවේන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනයයි. එහි ප්‍රමාණය අතිමහත්ය. මේ අවස්ථාවේ ශක්‍ර දේවේන්ද්‍රයා මේ පඩු ඇඹුල් සලසන බුදුන් වහන්සේගේ දහඅට රියන් පමණ වූ ශරීරයට අතිශයින්ම ප්‍රමාණයෙන් වැඩි බව දැනගෙන ඒ සඳහා කුමක් කරමෝදැයි කල්පනා කරන්නේය. බුදුන් වහන්සේ වනාහි ඔහුගේ එම අදහස් දැන පෑවා වූ ඍද්ධි බලය විස්මය ජනක ලෙස සිත්ලන්නා සුළු අයුරෙන් විද්‍යාචක්‍රවර්තීන් වර්ණනා කරන්නේ මෙසේය.

"මෙසේ සර්වඥයන් වහන්සේ දෙව්ලොවට වඩනා සඳ ශක්‍ර දේවේන්ද්‍රයා "ස්වාමි දෙව්ලොවට වඩනා දැ වන. දේවතාවනට වන්නේ මහා ඉෂ්ටයෙක. බල එකෙක් මත්න මාගේ මේ පාණ්ඩුකම්බල ශෛලාසනය දිග සැට යොදුන. පළල පනස් යොදුනැ. මේ සා මහත් ආසනයෙහි අටළොස් රියන් සර්වඥයන් වැඩහුන් සේක් වී නම්, ඉතිරි තැන්මැ බොහෝ වන්නේ වේ දැයි සිතීයැ. සර්වඥයෝ ඔහුගේ අභිප්‍රාය දැන තමන් වහන්සේ සඟල සිවුර සතර රියන් පුටුයෙක අතුරන්නා සේ අතුටලා ඒක මහත් ආසනයැ අසරම්ණිය බැඳගත් දෙදණ ඉද්දෙන් ඉතිරි ව නො තිබෙන පරිද්දෙන් වැඩහුන් සෙයකැ. ආසනය පිණිස තමන් වහන්සේ මහත් වූ දැත් නැත. තමන් වහන්සේ පිණිස ආසනය කුඩා කළ දැත් නැත. මෙසේ මහත් ඍද්ධි ඇති බුදුන්..""

බුදුන් වහන්සේ සැට යෙදුන් දිග ඇති. පනස් යොදුන් පළල ඇති, ඒ මහත් වූ ආසනය පුරා අටලොස් රියන් ශරීර ප්‍රමාණය ප්‍රමාණවත් කොට වැඩ හිඳ සියලු දෙවියන්ට විස්මය ඉපිද වූ සේක. එම ආසනය බුදුන් වහන්සේ කෙරෙහි කුඩා වීමක් ද බුදුන් වහන්සේ ආසනය කෙරෙහි විශාල වීමක් ද නොවී වැඩ හුන් බුදුන් වහන්සේ සියලු දෙවියන්ගේ විමතිය ඉපිද වූ සේක. මේ වනාහි බුදුන් වහන්සේගේ ඍද්ධි ප්‍රාතිහාර්ය බල මහිමයේ විපුලත්වයයි. එසේ වැඩ හුන් බුදුන් වහන්සේ මාතෘ දිව්‍ය රාජයා ප්‍රධාන කොට සිටි සියලු දෙවියන්ගේ අධිගමනය පිණිස විජම් පිටකය දේශනා කළ සේක. මෙම පාඨය කියන පාඨකයාටත්, අසන ශෝතෘ ජනයාටත් නිතැතින්ම බුදුන් වහන්සේගේ ඒ අත්‍යුත්තම ඍද්ධි ප්‍රාතිහාර්ය බලයේ විශාරදත්වය මනාව අවබෝධ වෙයි.

ඒ ඒ අවස්ථාවන් ඉතා වර්ණිතව කියා පාමින් විදුසක්විතීන් බුදුන් වහන්සේගේ ඒ ඍද්ධි ප්‍රාතිහාර්ය බල මහිමයේ විපුලත්වය ද මනාව ධ්වනිත කොට ඇත. අංගුලිමාල දමන කතාවේදී විදුසක්විතීන් තම වර්ණනාව වර්ණවත් කොට පාඨකයා හමුවේ තබන්නේ මෙසේයැ.

---

9. බුත්සරණ. (සංස්) - ලබුගම ලංකානන්ද හිමි, 1968. ජිනාසයිත එම්.ඩී. ගුණසේන සහ සමාගම, පිටු අංක 113.

"ඔහු දිවගෙන ගොස් එක් පියවරක් දෙ පියවරක් තබා ගිය සඳැ මහ පොළොව හෝ කඩාගෙනැ ගොස් අසූ - අනූ රියන් පසු බහවා පියයි. නැවත බුදුන් වහන්සේ හා ඔහු හා දෙ මැඳ අවීචි මහ නරකය සේවූ වළෙක් හෝ පැනී යෙයි. මහමෙර සේ උස් ගලෙක් හෝ පැනී යෙයි. දිවැ විඩාව ගොස් කට වියළී ගොස් නහවා ගෙන වැගිරෙන ඩහදිය කඳින් තෙමී ගොස් විස්මය පත් වැ මෙ මටැ පෙරැ වූ විරූ දැයෙක් නොවෙයි. පෙරැ මම වාත වේගයෙන් දිවන සෛන්ධවයන් සිසාරා අවුදු තුන් සතර විටෙකැ දිව පියා අල්වා ගෙනැ පොළව අපුළ පියමි. අද මා පෙරැ දිවෙන ජවය ශත සහස්‍ර ගුණයෙන් වඩාත් දිවෙන්නේ නමුදු මේ හීය දඬක් පමණ තැනින් වඩා නොබලා පියවරින් පියවරට මිහිකත සනහ සනහා මෙසේ මේ සෙමින් යන මහණහු හඹා ගත නො නෙමි. කිමෙක්දෝ හෝ යි විස්මයෙන් සිටැ, නැවත ගොස් "මහණ නො යායි කීයැ."[10]

කතුවරයාගේ මෙම වර්ණනාවෙන් අංගුලිමාලගේ ජව සම්පත්තියෙහි ප්‍රමාණයත්. එම ජවය යොදා බුදුන් වහන්සේ හඹාගත නො හැකිව ඩාබිඳෙන් සර්වාංගය තෙත් වී ගිය අයුරුත් මනාව වර්ණිතය, එවැනි බල තෙද ඇතියෙකු පවා බල පමණින් දිවන්නේ පියවි ගමනින් වඩනා බුදුන් වහන්සේ සමීපයට ළඟාවිය නො හැක්කේය. බුදුන් වහන්සේ ඔහුගේ ජවයට හා සමාන ගමනකින් නොවැඩියේ ඉදු බෙලෙන් ඔහුගේ ගමනට මාර්ග බාධක පැනවීය. බඹයක් පමණ දුරින් දෙදෙනා ආසන්න වත්ම අවීචි මහා නරකය සේ වූ ආගාධයක් මවන්නේය. නැතිනම් මහමේරු පර්වත රාජයා සේ වූ ගොඩැල්ලක් මවන්නේය. ඒ ක්‍රමයෙන් ම ඔහුගේ මත් බිඳෙනා තෙක් ඔහු ගමන් කරවන්නේය. වාත වේගයෙන් දිවෙන අශ්වයන් පවා අල්වාගෙන පොළෝ තෙළෙහි අපිල්ලුව ද පියවි ගමනින් වඩනා බුදුන් වහන්සේ හමාගත නොහැකිව විස්මයට පත් වූ අංගුලිමාල තම බල බිඳී ගොස් මේ ආශ්චර්යය, අද්භූත සිදුවීම් වැලෙන් පීඩිතව ගිය සිරුරු ඇත්තේ බුදුන් වහන්සේට ආමන්ත්‍රණය කරන්නේය. ඒ අවස්ථාව ධර්ම දේශනා කරන්නට අවස්ථාව කරගත් බුදුන් වහන්සේ ඔහුට දම් දෙසා සරණසීල පිහිටුවා අධිගමනයට මග හෙළි කරදුන් සේක.

එම කතාව අවසානය තෙක් කියවන පාඨකයා බුදුන් වහන්සේගේ ඒ උතුම් ආධ්‍යාත්මික ගුණ සමුදාය කෙරෙහි නිරන්තරයෙන්ම ගෞරව උපදවා බැති පෙම් වඩවා ගන්නේය. මව මරා ආනන්තර්ය පාප කර්මය අබිමුව සිටි අංගුලිමාල ආර්ය මාර්ගයට අවතීර්ණ කොට එහි ප්‍රතිෂ්ඨානය කිරීම සඳහා බුදුන් වහන්සේ පළමුවෙන් යොදාගත් උපක්‍රමය වූයේ තම ඍද්ධි ප්‍රාතිහාර්ය බලයයි. විද්‍යාචක්‍රවර්තීන් බුදුන් වහන්සේගේ එම ඉදු පෙළහර අවස්ථා වර්ණනා කරන විට දෙමඟෙක සිත් විහිදෙන සංකල්ප රූප පාඨකයාගේ මනසෙහි චිත්‍රණය කර දක්වයි. "විඩාවැ ගොස් කට වියළී ගොස් නහවා ගෙන වැගිරෙන ඩහදිය කඳින් තෙමී ගොස්" යන වැකියත් එහිම ඇතුළත් "පියවරින් පියවරට මිහිකත සනහ සනහා මෙසේ යෙමින්" යන වැකියත් එක්ව පාඨයකට ඇතුළත් කොට දැක්වීමෙන් කතුවරයා පාඨකයාගේ සිත තුළට ඇතුළත් කරන චිත්තරූප ක්ෂණයෙන් වෙනස් කොට දැක්වීමට සමත් වේ.

10 බුත්සරණ, එම. පිටු අංක 124.



එසේ චිත්තරූප වෙනස් වූ පාඨකයා සිතන්නේ ඒ බුදුන් වහන්සේගේ අල්පමාත්‍ර වූ ඉදු පෙළහර බලයෙකින් මෙවිතරක් හාස්කම් පාන්නක් නොවේද යනුවෙන්ය.

බුත්සරණෙහි එන ජටිල දමන කතාව තුළ බුදුන් වහන්සේ පෑ අනේක විධ ඍද්ධි ප්‍රාතිහාර්ය බලයන් මොනවට වර්ණනා කොට ඇද්දැයි සිතාගත හැකිය. එම ජටිල දමන කතාව පුරාවටම බුදුන් වහන්සේ දක්වා වදාළ ප්‍රාතිහාර්ය බලයන් රාශියක්ම සංගෘහිතය. උරුවෙල් කාශ්‍යපගේ අරම්හි වෙසෙන නාග රාජයා දමවාපු අයුරුත් ඒ සඳහා බුදුන් වහන්සේ තම ඍද්ධි ප්‍රාතිහාර්ය බලය යොදාගත් අයුරුත් විදුසක්විතීන් කදිමට වර්ණනා කොට ඇත.

"අපි දු ඉදින් ධූමයක් හළමෝ නම් මේ නාග රාජයා තමා මුළු ලොවමැ ඉවසාගත නොහැක්කේයැ. බල එකෙක් මත්තැ? මේ නයි දුමන්නට මම්මැ සුරුමි. සිතු කල්හි තමාගේ ශක්ති පැවැ මනා වේද එහෙයින් මාගේ ශරීරයෙන් නැංගා වූ මේ ධූමය මේ නාග රාජයාගේ ශරීරයෙහි ඡවිමාංසාදී වූ කිසි අවයවයකට උපද්‍රව නෙ කෙරෙව' යි සිතා වදාරා ශ්‍රී ශරීරයෙන් දුම් හරනට පටන් ගත් සේකැ. ඒ සර්වඥයන් වහන්සේගේ ශරීරයෙන් නැංගා වූ ධූමය නාග රාජයාගේ විෂ ධූමයට ඔබාගෙනැ ඔහුගේ ශරීරයෙහි ඡවිමාංසාදී වූ කිසි අවයවයකට උපද්‍රව නො කොට ඔහු පෙළන්නට වනැ...... ඉක්බිති නාගරාජ තෙමේ සර්වඥයන් වහන්සේගේ ප්‍රභාව දැක ක්ෂමා කොටගත නොහී කෝපයෙන් එක පැහැර විෂාග්නි හරනට පටන් ගත. සර්වඥයන් වහන්සේ ද ශරීරයෙන් ගිනි හරනා උපාය තොපට මුත් අපට නැත්තේ නො වෙයි සිතා වදාරා තමන් වහන්සේද තේජෝ ධාතුවට සම වැද තමන් වහන්සේගේ ශරීරයෙන් ගිනිකඳ හරනට පටන් ගත් සේක."[11]

උරුවෙල් කාශ්‍යපගේ අරම්හි ජීවත්වන නාග රාජයා කිසිවෙකුටත් දමනය කළ හැකි සත්වයෙක් නොවීය. බුදුරජාණන් වහන්සේ ඔහුට කළ විශේෂ පෙළහර දැක්වීමක් ද නොවූහ. නාග රාජයා දැක් වූ සියලු බලයන් ව්‍යර්ථ කොට ඔහුට දැක්විය හැකි ඒ සියලු බලයන් තමනට ද දැක්විය හැකි නොවේ දැයි දක්වන අයුරින් බුදුන් වහන්සේ ඉදු පෙළහර පෑහ. බුදුන් වහන්සේගේ ඒ ඉදු පෙළහර දැක්වීමේ අභිප්‍රාය වූයේ නාග රාජයාගේ විනාශය සිදු කිරීම නොවේ. දෙදෙනාගේ ඒ අන්‍යතර වූ චේතනාවෙන් නිවැරදිව හඳුනා ගැනීමට පාඨකයාට ඉඩ හසර ලබා දෙමින් කතුවරයා එම අවස්ථාව වර්ණනා කරයි. එය කියවන පාඨකයා බුදුන් වහන්සේ කෙරෙහි නිතැතින් ම සිනෙහැති වන්නේය. ගෞරව උපදවන්නේය. තමන් නසන්නට උපක්‍රම යොදන කවරෙකුට වුවද බුදුන් වහන්සේ මෙත් සිත් උපදවා තම අසීමිත බුද්ධ බලයෙන් අබැටක් පමණවත් නොයොදා ඔවුන් ද සබ්‍රහ්ම මාවතට හැරලන අයුරු පාඨකයා එමගින් අවබෝධ කර ගනියි.

11 බුත්සරණ, (සංස්) - උඩුගම ලංකානන්ද හිමි. 1968. සීළාසගිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. පිටු අංක 148.

ඒ නාග රාජයා දමනය කොට තම පාත්‍ර ධාතුවේ හොවා ගෙන පසුදින උරුවෙල් කාශ්‍යපට පෙන්වන අවස්ථාවේ ඒ විෂකුරු නයි බුදුන් වහන්සේගේ ඒ ආශ්චර්යාත්මක බල මහිමයෙන් කවර තත්ත්වයකට පත්වීද යන්න කතුවරයා ඉතාමත් සිත් ගන්නා ආකාරයෙන් වර්ණනා කරන්නේ මෙසේය.

"කාශ්‍යප තා ඊයේ තාගේ නයිගෙ ආනුභාව කී නියා කෙසේද? දැන් මූ හොත් නියා කෙසේද? තො මැ බලා' යි වදාරා පාත්‍රයේ හොත්තා වූ නයි ඕහට දක්වා වදාළ සේක. ඉක්බිති ඒ නාගතෙමේ බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛය බල බලා භක්තින් හිස හකුළුව හකුළුවා පාත්‍ර ධාතුන් වහන්සේ ඇතුළත්හි හොත්තේ යැ. ඒ ආශ්චර්ය දුටුවා වූ උරුවේල කාශ්‍යපතෙමේ මේ මහා ශ්‍රමණයෝ ඉතා සෘද්ධි ඇති කෙනෙක. මුන්හට අඩුනම් අප සේ රහත් නොවූ බව මැ යැයි සර්වඥයන් වහන්සේ සෘද්ධි ඇති බව මුත් රහත් කම් තමා කෙරෙහි මැ තබාදිට...."[12]

නාගයාගේ ස්වරූපය මුලින් අසන පාඨකයා ඔහුගේ විෂඝෝර ස්වරූපය පිළිබඳ නැති ගත් සිත් ඇත්තෙකු වුවත් මෙම පාඨය කියවන කල්හි ඔහුගේ ඒ චිත්ත වික්ෂිප්තභාවය පහව ගොස් නාග රාජයාගේ දැමුණු ස්වරූපය කවරාකාරයකින් සිද්ධ වීද යන්න අවබෝධ කර ගනියි. "ශ්‍රී මුඛය බල බලා භක්තින් හිස හකුළුව හකුළුවා" වැනි වදන් යෙදීම ඒ සඳහා කදිම මං පෙත් විවර කරදීමකි.

ඉන් පසුව උරුවේල කාශ්‍යප තෙරුවන් ගුණ පිහිටුවා තිවත් අවබෝධ කරවන තෙක් වූ අවස්ථා වර්ණනාව තුළ බුදුන් වහන්සේ විසින් දක්වන්නට වූ විවිධ සෘද්ධි ගුණයන් විද්‍යාචක්‍රවර්තීන් මුද්‍රිත පිටු හයක් පමණ මිඩංගු කර වර්ණනා කොට ඇත. ජටිල දමනය කියවන පාඨකයාට එහි වැඩි කොටසක් වර්ණනා දැකගත හැකි වන්නේ බුදුන් වහන්සේගේ සෘද්ධි ගුණ සම්පත්තියයි. බුදුන් වහන්සේ තමන්ගේ අධිෂ්ඨාන බලයෙන් පෑ විවිධ වූ වික්‍රමයන් හමුවේ අවසන උරුවේල කාශ්‍යප ප්‍රකාශ කරන්නේ "මේ ශ්‍රමණයෝ නො එක් සෘද්ධි දක්වන්නට සමත් වුව මා මෙන් රහත් මගට පිළිපත් වූවෙක් නොවේය." යනුවෙනි. අවසන උරුවේල කාශ්‍යප ගඟ වතුරෙන් බුදුන් වහන්සේ බේරාගත යුතුයැයි සිතා පහුරක් හැරගෙන බුදුන් වහන්සේ සොයා ආ ගමනේ, දියෙහි නො ගැටී සක්මන් කරන බුදුරදුන් දැක ඒ ආශ්චර්යයෙන් ද පුදුමයට පත්ව අවසානයේ බුදුන් වහන්සේගෙන් බණ අසා රහත් මගට පිළිපන්නේ වන. විද්‍යාචක්‍රවර්තීන් මෙම ජටිල දමන කතාව ලිවීමේදී ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ බුදුන් වහන්සේගේ සෘද්ධි ප්‍රාතිහාර්ය ගුණ මහිමය පාඨකයාට ඒත්තු ගැන්වීමේ දැඩි අදිටනින් බව පෙනේ. එමගින් කතුවරයා බලාපොරොත්තු වූයේ පාඨකයා තුළ බුදුන් වහන්සේ කෙරෙහි වඩ වඩාත් ශ්‍රද්ධා භක්තිය ජනිත කරවා ඔවුන් තෙරුවන්හි සැදැහැ ඇත්තන් කරවීමයි. ඒ සඳහා ඔහුගේ රචනා නියර අතිශයින් ප්‍රයෝජනවත්ය.

12 බුත්සරණ, එම, පිටු අංක 149.



ආලවක දමන කතාව ද විද්‍යුසක්විතීන්ගේ අතිශය වර්ණනාවට ලක් වූ කතාවකි. එහි ද බුදුන් වහන්සේගේ විවිධ වූ විචිත්‍ර වූ සෘද්ධි ප්‍රාතිහාර්ය බලමහිමයන් අන්තර්ගතය. පුලුන් පෙදක් සේ අල්වා පරසක්වල ගසාපියමි' යි උදම් ඇනූ ආලවක යක්ෂයා විවිධ ඉදු පෙළහර දක්වාලමින් බුදුන් වහන්සේට උපද්‍රව කරන්නට උත්සාහ කළේය. ආලවක යක්ෂයාගේ එම වික්‍රමයන් බුදුන් වහන්සේට අනතුරක් කරන්නට නොවූ අයුරු හා බුදුන් වහන්සේගේ ආශ්චර්යාත්මක අධිෂ්ඨාන බලය එම වික්‍රමයන් නොවන්නට පෑ අයුරු ඉතා හරවත් කොට වර්ණනාත්මකව විද්‍යාචක්‍රවර්තීන් කියූ අයුරු ශ්‍රද්ධා භක්ති සම්පන්නය. ඉතා බිහිසුණු නවවිධ වර්ෂා වස්සවා නොයෙක් භූතයන් මවා පා ඒ භූතයන් බුදුන් වහන්සේගේ ශ්‍රී පාද පද්මයන්ගේ ඇලයට ගිය කල්හි එහි රැස් වූ දෙව් දේවතාවන්ගේ මුවඟට නංවන වදන් වැල බුදුන් වහන්සේගේ ආශ්චර්යාත්මක බව දක්වන්නා සේම ආලවක යක්ෂයාට කරන සරදම් වර්ණනාවක් ද වන්නේය. එම වර්ණනාව පාඨක ශ්‍රාවක උභය පිරිසට නිරන්තරයෙන්ම බුදුන් වහන්සේ කෙරෙහි වික්‍රම පාන්නට ආ ආලවක යක්ෂයා කෙරෙහි සිනහා උපදවන්නේය. ඒ විතරක් නොව ආලවක වැනි යක්ෂයන් සිය දහසක් සිය දහස් අයුරෙන් වික්‍රම කරයි ද එම වික්‍රමයන් බුදුන් වහන්සේ හමුයෙහි වික්‍රම නොවන බව වටහා ගන්නේ බුද්ධාලම්බන ප්‍රීතිය හදවත්හි තැම්පත් කරගෙනය.

"ඒ භූතයන්ගේ විකාර සිත්තමැ ඇඳි විකාර බලන්නා සේ නිසරුව බල බලා සර්වඥයන් වහන්සේ වැඩ හුන් කල්හි එතනට කැටි වූ දේවතාවන් අතින් අත් පැහැර සිනාසී ආලවක පවනින් බුදුන් සොල්වාපි සේ ඉතා යහපත. වතුරින් උපුල්වාපි සේත් ඉතාමැ යහපතැ. පහනින් ගසා භය ගන්වාපි නියාත් ඉතා යහපත. ආයුධ වැස්සෙන් සිඳැ බිඳැපු නියාත් ඉතාම යහපත. මඩ වැස්සෙන් එරවාපි නියාත් ඉතාම යහපත..... මේ වික්‍රම කොයින් සෙයින් උගත්හිද? තවද නුකුසීවැ දසය මුළුලු කොටැපියැ. තා නො හැඳින බුදුන් තගේ ගෙයි හුන්නයි සිතිද? අහ වැළකැයා අහා වැළැකයා. අපගේ බුදුරජාණන් වහන්සේ හැරපිය. හැරපිය. අපගේ පැරැත්තට බුදුන් අදට හැරපියැ'යි කියා මතැතක් හට හුසි ගන්වන කුකුරු බිළිඳක්හු සෙයින් සෙ අනවරතයෙන් මෙසෙ වෙහෙසන දේවතාවන් අතුරෙහි අනික් යමක් කොට ගත නොහී ලජ්ජාවට පැමිණ තමාගේ වික්‍රමයෙහි නිමාවට තැකූ වේලායුධය ගත."[13]

මෙම පාඨයේ දී ආලවකයන් බුදුන් වහන්සේ වෙහෙසෙන්නට ගත් සියලු ඉදු බලයන් දේවතාවන්ගේ මුවඟට නංවා කෙටියෙන් මතක් කර දෙයි. එහි විස්තර වර්ණනා මුල් පාඨ වලින් දක්වා ඒ ඉදු පෙළහර බුදුන් වහන්සේට පෙළහර නොවූ හැටි කියා මෙහිදී දෙවියන්ගේ මුවඟට එය නැවතත් නැංවීමෙන් කතුවරයා බලාපොරොත්තු වූයේ ආලවක චරිතය පාඨකයාගේ සරදමට තව තවත් ලක් කරවීමයි.

13 බුත්සරණ, (සංස්) - ලබුගම ලංකානන්ද හිමි, 1968, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, පිටු අංක 148.

කතුවරයා මෙහිදී යොදා ගන්නා උපමාව ඒ සඳහා බෙහෙවින්ම උචිතයැ. "මතැතක් හට හුසි ගන්වන කුකුරු බිලිඳක්හු සේ" ආලවකයාගේ චරිතය මෙතරම් දුර්මුඛ කොට ඔහු අන්‍යයන්ගේ අවමානයටත් සරදමටත් ලක් කරමින් කතුවරයා බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා භක්ති වර්ධනය කරවීමට ගෙන ඇති රචනා ශෛලිය ඉතා වැදගත්යැ. ආලවක යක්ෂයාගේ සියලු ඉදු බලයන් වනාහි සුනඛ පෝතකයෙකුගේ ක්‍රියාවන් හා සමකොට එහිදී බුදුන් වහන්සේ මතැතෙකු ලෙසින් දැක්වීමෙන් කතුවරයා බලාපොරොත්තු වූයේ බුදුන් වහන්සේගේ ඍද්ධි බලමහිමය උතුම් බව දැක්වීමටයි. එය එසේම සිදු වී ඇත. මේ සියලු උපක්‍රම බුදුන් වහන්සේට පීඩා දෙන්නට සමත් නොවූ කල්හි ඔහුගේ අවසන් උපක්‍රමය වූ වේලායුධ ගෙන එයින් බුදුන් වහන්සේට පහර දුන්නේය. එම වේලායුධයෙහි බලපරාක්‍රමය ගැන කතුවරයා මුලින් දිගු විස්තරයක් කොට අවසන එම ආයුධය බුදුන් වහන්සේ හමුයෙහි පා පිස්සක් වූ අයුරු දක්වන්නේ මෙසේයැ.....

> "ගිනිසිළු දශ දිශායෙහි ඉස්මින් ආයුධය හඬා බැසැ බුදුන්ගේ ශ්‍රී පාදය පිස්නට තබා ලූ බිසි කඩක් සේ හැකිළී ලා බුදුන් පාමුලහි වැටිණ. දේවතාවන්ගේ සාධුකාර දස දහසක් සක්වලැ එකහෙළා පැතිරෙන්නට වන."[14]

මෙම අවස්ථාව කියවන පාඨකයා නිතැතින්ම බුදුන් වහන්සේගේ ඒ ඍද්ධි බලමහිමය පිළිබඳව වඩ වඩාත් ශ්‍රද්ධා සම්පන්න වන්නේයැ. ආලවක යක්ෂයාගේ ඒ විකුම් ඇති. බල ඇති වේලායුධය වනාහි බුදුන් වහන්සේට පා පිස්සක් වූ කල්හි කරකියා ගත නොහුණු දෙයක් ඇති යකු බුදුන් වහන්සේ ඇවිදුවා වෙහෙස කරවන්නටත් නොහැකිව බුදුන් වහන්සේගෙන් ප්‍රශ්න විචාළීය. එම අවස්ථාව දම් දෙසීමට වේලාව කරගත් බුදුන් වහන්සේ ඔහුට දම් දෙසා තිසරණ ගැන්වූ සේක.

බුත්සරණ කතුවරයාගේ අවස්ථාව හා සිද්ධි වර්ණනයෙන් බුදුන් වහන්සේගේ ඒ උත්කෘෂ්ට ඍද්ධි ප්‍රාතිහාර්යයේ බලය මනාව පැහැදිලි කරයි. විවිධ වර්ගයේ අදාන්ත වූ චරිත දමනය කිරීමට බුදුන් වහන්සේ විවිධ වර්ගයේ ඍද්ධි ප්‍රාතිහාර්ය බලයන් යොදා ගෙන ඇත. ඒ සියලු වර්ගයේ චරිත අනුගත වන සේ බුත්සරණ කතුවරයා තම ග්‍රන්ථයට වස්තු විෂය සපයාගෙන ඇත. ග්‍රන්ථය සම්පාදනය වන යුගය වන විට සමාජයේ බැස ගෙන තිබූ නිර්මාණවාදී සංකල්ප හා තුලනාත්මක වන අයුරෙන් බුදුන් වහන්සේ තත් ඍද්ධි විෂය යොදා ගත් අවස්ථා කතුවරයා තෝරා බේරාගෙන ඇත. එමගින් බුත්සරණ කතුවරයා වර්ණනාත්මක රීතියට අනුගත වෙමින් කරන වර්ණනාවන් පාඨක සිත්හි නිරන්තර බුදුගුණ කෙරෙහි බැති පෙම් උපදවාලයි.

14 බුත්සරණ. පම. පිටු අංක 149.



## රචනා රීති

සංවර්ණනා මාර්ගය රචනාවේ වැදගත් අංගයක් කොට තැකූ විද්‍යාචක්‍රවර්තීන් බුදුන් වහන්සේගේ ඒ අසමසම අතුල්‍ය අවේද්‍ය වූ ඍද්ධි ප්‍රාතිහාර්ය බලය තීව්‍ර කොට දැක්වීම සඳහා යොදාගත් රචනා උපක්‍රමයන් මෙසේ සංග්‍රහ කොට හඳුනා ගත හැකිය.

I. ඇතැම් තැනකදී බුදුන් වහන්සේගේ දේශනාවට මුසු කොට යොදන ඍද්ධි ප්‍රාතිහාර්ය බල මහිමයේ විශිෂ්ටත්වය කියා පෑම
II. ඍද්ධි ප්‍රාතිහාර්ය බලයන් දැක්විය හැකි සතුන් දමා ඔවුන්ගේ මුවඟට නංවන ප්‍රශංසාත්මක ගුණ ගායනය
III. බුදුන් වහන්සේ හමුවෙහි ඍද්ධිබල දක්වන්නට ඉදිරිපත් වන ඇතැම් සත්වයන් ඒ සඳහා නො පොහොනා කල්හි හාත්පස සත්වයන් ලවා ඔවුනට උපහාස කරවීම
IV. භාෂාත්මක වශයෙන් විවිධ රචනා උපක්‍රම යොදා ගැනීම තුළින් (උපමා රූපකාදී අලංකාර මෙන්ම අතිශය වර්ණනා)

"බුත්සරණ ගද්‍ය කාව්‍ය ස්වරූපයක් උසුලයි. කාව්‍ය ගණයෙහිලා සැලකිය හැකි ගද්‍යයෙන් ලියවුණු ඕනෑම රචනයක් ගද්‍ය කාව්‍යයක් වශයෙන් ගිණිය හැකි වුවද බුත්සරණ සිංහලයේ අන්‍ය ගද්‍ය කාව්‍යයන්ගෙන් වෙන් කරන ලක්ෂණ ද වේ. ගද්‍යයෙන් ලියන ලද වුවද වෘත්තයකට අයත් ලක්ෂණ එහි ඇත. සාමාන්‍යයෙන් පද්‍ය පිළිබඳ සැලකෙන වෘත්තය බුත්සරණෙහි ඇතැම් තැනක ගළපා ඇති අයුරු ග්‍රන්ථය කියවීමෙන් පෙනී යන කරුණකි. කුඩා රළ කිහිපයක් එක් වීමෙන් විශාල තරංගයක් ඇතිවන්නා සේ කෙටි වාක්‍ය ඛණ්ඩ කිහිපයක් එක පිට එක පැටලීමෙන් දීර්ඝ වාක්‍යයක් ඇති වේ. එබඳු දීර්ඝ වාක්‍ය මේ ගද්‍ය රීතියේ විශේෂ ලක්ෂණයකි."[15]

ඉහත දැක්වූ ක්‍රමයන්ට අනුගත වෙමින් විද්‍යාචක්‍රවර්තීන් බුදුන් වහන්සේගේ ඍද්ධි ප්‍රාතිහාර්ය බල මහිමය වර්ණනාවට හසුකර ගනියි. එමගින් පාඨක ජනතාවගේ සිත් සතන් තුළ බුදුන් වහන්සේ කෙරෙහි වඩ වඩාත් ශ්‍රද්ධා භක්තිය ජනිත කරවීමට උත්සාහ ගෙන ඇත. බුත්සරණෙහි මෙම රචනා ශෛලිය පාඨකයාගේ බුද්ධියට වඩා හදවතට සමීප වූ ශෛලියකි.

පොළොන්නරු යුගයේ දී ලාංකේය ජනතාව තුළ මුල්බැස ගනිමින් තිබූ නිර්මාණවාදී සංකල්පය තුළ බුදුන් වහන්සේට වඩා දෙවියන් උසස් තත්වයෙහිලා සලකනන්ට වන. එය ථෙරවාදී බුදු දහමට පටහැනි බැවින් ද, අසත්‍යයෙන් සත්‍යය යටපත් වන බැවින් ද, එහි යථා ස්වරූපය ජනතාවට පෙන්වා දීම එදවස සිටි උගත් භික්ෂූන්ගේ කාර්යභාරය විය. එබැවින් ඒ අසත්‍යයෙන් වැසී ගියා වූ සත්‍යයට නව මං එළි කරමින් තත් යුගයේ උගත්හු ග්‍රන්ථකරණයට බටහ.

15 කුලසූරිය ආනන්ද, සිංහල සාහිත්‍ය 01, 1999, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පි.අ. 192.

එම ජාතික ආගමික සත් කාර්යයට උරදුන් විද්‍යාචක්‍රවර්තීහු ද බුදුන් වහන්සේගේ ඒ අසමසම වූ නව අරහාදී බුදුගුණයන්ම වස්තු විෂය කොට ගෙන බුත්සරණ ලියා පාඨක ජනතාව තුළ බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා භක්ති ජනිත කරවීමෙහිලා උත්සුක වූහ.

සර්ව බලධාරී දෙවියන්ට ලෝකයේ මැවීමත්, පැවැත්මත්, නැවැත්මත් භාර කරමින් මංමුලා වූවන්ට විද්‍යාචක්‍රවර්තීන් බුත්සරණෙහි දී නියම පිළිතුර ලබා දුන්නේය. ඒ දෙවි බඹ ශක්‍ර ආදීන් ද බුදුන් වහන්සේට සව්වන් වූ අයුරු විවිධ වර්ණනා තුළින් ඉදිරිපත් කිරීමෙනි. බුදුන් වහන්සේට සව්වන් වූ අයුරු විවිධ වර්ණනා තුළින් ඉදිරිපත් කිරීමෙනි. බුදුන් වහන්සේ දැක් වූ විවිධ බලයන් අතර ඍද්ධි ප්‍රාතිහාර්ය බලය මෙහිදී කතුවරයා අතිශය වර්ණනා කරමින් සක්වල බුදුන් වහන්සේට වැඩි කෙනෙකුන් නැති බව පෙන්වා දුන්නේය. තද් විවිධ විෂයක කරුණු පදනම් කරගෙන රචිත බුත්සරණ විශේෂයෙන්ම පාඨක ජනතාවගේ ශ්‍රද්ධා භක්තිය බුදුන් වහන්සේ කෙරෙහි ඇති කරවීය. ඒ සඳහා කතුවරයාට බුදුන් වහන්සේගේ ඍද්ධි ප්‍රාතිහාර්යාදී බල මහිමයන් පිළිබඳ වඩ වඩාත් වර්ණනා කරන්නට සිද්ධ විය. එහි අවසාන ප්‍රතිඵලය පශ්චාත් කාලීන විචාරකයන් දකින්නේ මෙලෙසිනි.

"සකල බුද්ධ ධර්මය අළලා ලියැවුණු හුදී ජනයා අතර බුදුන් වහන්සේ කෙරෙහි භක්තිය ඇති කිරීමට සමර්ථ වේ. එහි දැක්වෙන හැම කතා වස්තුවක්, හැම පාඨයක්ම සකසා ඇත්තේ ඒ බුද්ධ භක්තිය දියුණු කරන අයුරෙනි."[16]

බුද්ධ ධර්මය අළලා තම ග්‍රන්ථය රචනා කරන විද්‍යාචක්‍රවර්තීන්ගේ ඒකායන බලාපොරොත්තුව වී ඇත්තේ පාඨක ජනතාවගේ සිත් සතන් තුළ බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධා භක්ති ජනනය කරවීමයි. ඒ සඳහා ඇවැසි සියලු උපාය මාර්ග කතුවරයා තම රචනයට ඇතුළත් කරගෙන ඇත.

බුත්සරණ කතුවරයාගේ මේ අභිමත වර්ණනා රීතිය පිළිබඳව ඇතමෙක් පාඨක පක්ෂයේ සිට දෝෂාරෝපණය කරති. ඒ මෙවැනි වර්ණනා අවස්ථා නිසා පාඨක සිත් වෙහෙසන්නකි යි සිතා ගෙනය. සාමාන්‍ය පාඨක ජනතාව හෝ ශෝතෘ ජනතාවගේ පැත්තෙන් එම දෝෂාරෝපණය එතරම් සාධාරණ නොවන බව අපගේ හැඟීමයි.

16 කුලසූරිය ආනන්ද, සිංහල සාහිත්‍ය 01, 1999, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, පි.අ. 187.



479 - 10



"බුදුන් වහන්සේගේ හා ශ්‍රාවකයන්ගේ ද ඍද්ධි වික්‍රම වර්ණනය කෙරෙන නන්දෝපනන්ද දමනය විචාර බුද්ධියෙන් සකස් වුණු ශ්‍රද්ධාව ඇතියන්ගේ සිත් නොගන්නා නමුදු බුදු දහමෙහි නො ගැඹුරු පක්ෂයෙන් පෝෂිත ශ්‍රද්ධාව ඇත්තන්ගේ සිත් වීර රසයෙන් හා අද්භූත රසයෙන් ද පිනවයි. තීර්ථක දමනය, ජටිල දමනය, ගංගාරෝහණ කථා අනුචිත වර්ණනයෙන් දික් කරවන ලද නමුදු පාඨකයාගේ සිත් ගනියි."[17]

ග්‍රන්ථ විචාරයේදී යොදා ගන්නා සංකල්ප අතරට ග්‍රන්ථ සම්පාදන යුගයේ සමාජ අවශ්‍යතාව ද ඒ විචාරකයන් අවබෝධ කරගත යුතුය. ඒ පිළිබඳව අවධානය යොමු කරන අයෙකු නම් විදුසක්විතීන්ගේ මෙම රචනා නියර කෙරෙහි දොස් නඟනු නැත.

කෙසේ වුව ද විද්‍යාචක්‍රවර්තීන් යුගයේ අවශ්‍යතාව තේරුම් ගෙන බුදුන් වහන්සේ සක්වල සියලු සතුනට ශාස්තෘ වූ අයුරුත් අසමසම වූ අයුරුත් මනා කොට වර්ණනාවට හසු කරගෙන ඇත. ඒ සඳහා තමන් තෝරා ගත් සිද්ධි හා අවස්ථා වර්ණනා බෙහෙවින් උචිතය. නිර්මාණවාදී මත ගත්තවුන්ට ඒ සංකල්ප සාවද්‍ය යැයි හැඟෙන තරමටම බුදුගුණ වැනූහ. ඒ අතරත් කතුවරයා බුදුන් වහන්සේගේ ඒ ඍද්ධි ප්‍රාතිහාර්ය බලයේ තරම කියා පෑවේය. ඒ රචනා ශෛලිය හුදෙක්ම පාඨක හා ශෝතෘ ජනතාවගේ සිත් තුළ බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව, ගෞරවය, භක්තිය ජනිත කරවන්නේ ය. එයට ඇවැසි පොහොනා සිද්ධි හා හරවත් ශෛලියක් කතුවරයා තෝරාගෙන ඇත. එමගින් නිරන්තරයෙන්ම පාඨක සිත බුද්ධාලම්බන ප්‍රීතියට නමන්නේය. ඒ සඳහා ඔහුගේ වර්ණනා උචිතය. හරවත්ය. අභිමත කාරණා ඉටුකර ගැනීමට බෙහෙවින්ම සුදුසු වූයේ යැ.

17 වික්‍රමසිංහ මාර්ටින්, සිංහල සාහිත්‍යයේ නැගීම, 1997, තිසර ප්‍රකාශකයෝ දෙහිවල, පිටු අංක 87.